**2024-03-04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ආයෝජන කාර්යයන් සඳහා රජයේ හා ව්‍යවස්ථාපිත ආයතන සතු ඉඩම්, විධිමත් ලෙස බැහැර කිරීම සඳහා ඉඩම් කළමනාකරණ භාරය ස්ථාපිත කිරීම**

මෙරට මුළු බිම් ප්‍රමාණයෙන් 82%ක පමණ භූමි ප්‍රමාණයක හිමිකාරීත්වය රජය සතු අතර එම ඉඩම් ආරක්ෂා කිරීම හා පාලනය කිරීම රජයේ ආයතන ගණනාවකට පැවරී ඇත. එකී ආයතන විසින් ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් රජයේ ඉඩම් ආයෝජන කටයුතු සඳහා නිදහස් කිරීමේදී විවිධ ගැටලු පැන නැගී ඇති බව පෙනී ගොස් තිබේ. එබැවින්, නව කර්මාන්ත හා සේවා ඇති කිරීම සහ නව රැකියා අවස්ථා සුලභ කළ හැකි ආයෝජන අවස්ථා දිරිගැන්වීම පිණිස, සුදුසු විභවයන් සහිත ඉඩම් හඳුනා ගන්නා අවස්ථාවේ සිට ආයෝජකයන් වෙත පාරදෘශ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කරමින් විධිමත්ව ඉඩම් නිදහස් කිරීම දක්වා නිසි බලතල සහිත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යව ඇත. ඒ අනුව, රජයේ හා ව්‍යවස්ථාපිත ආයතන සතු ඉඩම් ආයෝජකයින් වෙත නිදහස් කිරීමට අදාළව යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති ලේකම්ගේ සභාපතිත්වය යටතේ අදාළ සියලු අමාත්‍යාංශවල හා ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත ඉඩම් කළමනාකරණ භාරය ස්ථාපිත කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යාපනය වැඩිදියුණු කිරීම මඟින් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීම**

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික උපායමාර්ගයට අනුකූලව ආර්ථික වර්ධනය සහ නවෝත්පාදනය ඇති කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යාපනය වැඩිදියුණු කිරීම තුළින් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇති අතර විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය නිපුණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා එමඟින් හැකියාව ලැබෙනු ඇත. බලපත්‍රලාභීන්ගෙන් අයකරනු ලබන විදුලි සංදේශ සංවර්ධනගාස්තුවෙන් 50%ක් විදුලි සංදේශ කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා භාවිත කිරීමට හෝ



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තෙ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ලබා දීමට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත බලය පැවරී තිබේ. ඒ අනුව, අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස උගන්වනු ලබන පාසල් 1,000ක් වෙත අවශ්‍ය උපකරණ විදුලි සංදේශ සංවර්ධන ගාස්තු අරමුදලේ ප්‍රතිපාදන මඟින් ලබා දීමට හැකි වන පරිදි "සුහුරු පාසල් ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීමටත්, ජනාධිපති අරමුදලේ මෙහෙයුම් සහාය ඇතිව අ.පො.ස.(උසස් පෙළ)විභාගය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය හදාරනු ලබන අඩු ආදායම්ලාභී පවුල් 5,000කට මූල්‍යාධාර ලබා දීමේ ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කිරීමටත් තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා; සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 03. පොදු රේගු බන්ධිත ගුදම් නියම කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති රාමුව සඳහා අනුමැතිය

ආනයනික භාණ්ඩ සඳහා අදාළ වන බදු ගෙවීමට හා භාණ්ඩ ප්‍රවාහනය කිරීමට පූර්වයෙන් භාණ්ඩවල සුරක්ෂිතතාව හා ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා වන ගබඩා පහසුකම රේගු බන්ධිත ගුදමක් ලෙස හඳුන්වනු ලබයි. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 69 වන වගන්තියෙහි විධිවිධාන යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ මත මුදල් විෂය භාර අමාත්‍යවරයාට රේගු බන්ධිත ගුදම් නියම කිරීම සිදු කළ හැක. ගුදම් පහසුකම් තාක්ෂණයන්ගේ ඇති වී තිබෙන දියුණුව සහ සැපයුම් දාම ක්‍රියාවලිය තුළ තරඟකාරී වාසිය ඇති කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, පොදු රේගු බන්ධිත ගුදමක අනිවාර්ය අවම ඉඩ ප්‍රමාණය සංශෝධනය කළ යුතු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, රේගු ආඥාපනතේ 69 වන වගන්තිය යටතේ සකස් කරනු ලැබ ඇති "පොදු රේගු බන්ධිත ගුදම් නියම කිරීම සඳහා වන සංශෝධිත හා යාවත්කාලීන කළ ප්‍රතිපත්ති රාමුව" ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 04. කප්පම් මෘදුකාංගවලට එරෙහි ජාත්‍යන්තර සමාරම්භක සමුළුව

කප්පම් මෘදුකාංග පිටුදැකීම පිණිස ජාත්‍යන්තර සම්බන්ධීකරණය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය විසින් තවත් රටවල් කණ්ඩායමක් සමඟ 2021 වර්ෂයේදී පොදු වේදිකාවක් වශයෙන් ආරම්භ කරනු ලැබ ඇති කප්පම් මෘදුකාංගවලට එරෙහි ජාත්‍යන්තර සමාරම්භක පියවරට සම්බන්ධ වන ලෙස ශ්‍රී ලංකාවට ද ඇරයුම් කර ඇත. මේ වනවිට එම සමාරම්භක

පියවර සඳහා ලොව පුරා රටවල් 48ක් සහ යුරෝපා සංගමය මෙන්ම ජාත්‍යන්තර පොලිසිය ද සම්බන්ධ වී තිබේ. ශ්‍රී ලංකාව ද මෑතකාලීනව කප්පම් මෘදුකාංග හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බැවින්, කප්පම් මෘදුකාංගවලට එරෙහි ජාත්‍යන්තර සමාරම්භක පියවරට සම්බන්ධ වීමෙන් ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකි වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, කප්පම් මෘදුකාංගවලට එරෙහි ජාත්‍යන්තර සමාරම්භක පියවරට සම්බන්ධ වී ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා; සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ධාරිතාව මෙගාවොට් 1ක් බැගින් වන පාවෙන සූර්ය විදුලි බල උත්පාදන නියමු ව්‍යාපෘති දෙකක් චන්ද්‍රිකා වැව ජලාශය මතුපිට සහ කිරිඉබ්බන් වැව ජලාශය මතුපිට ආරම්භ කිරීම**

කොරියානු රජයේ Korea Institute for Advancement of Technology සහ ශ්‍රී ලංකාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය අතර අත්සන් තබා ඇති සාකච්ඡා සටහන අනුව චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව ජලාශවල ධාරිතාව මෙගාවොට් එක බැගින් පාවෙන සූර්ය විදුලි බලාගාර නියමු ව්‍යාපෘති දෙකක් (02) ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. එකී ව්‍යාපෘති දෙකට අදාළව විදුලි බලාගාර හා සම්ප්‍රේෂණ පොළ ඉදිකිරීම, තාඩන්තු ශ්‍රමිකයින් පුහුණු කිරීම සහ සූර්ය පැනල නඩත්තු කිරීම වැනි කටයුතු සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි චන්ද්‍රිකා වැව ජලාශයේ ජලය මතුපිට සහ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කිරිඉබ්බන් වැව ජලාශයේ ජලය මතුපිට හෙක්ටයාර 0.99ක් බැගින් වූ කොටස් සහ එම ජලාශ රක්ෂිතයන්ගෙන් හෙක්ටයාර 0.1 බැගින් වූ බිම් කොටස් ලබා දෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත්ව තිබේ. යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් ජාතික විදුලිබල පද්ධතියට ගිගාවොට් පැය 3ක පමණ වාර්ෂික විදුලි ජනනයක් එක් කිරීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, අදාළ සූර්ය විදුලිබල නියමු ව්‍යාපෘති දෙක (02) පවත්වාගෙන යාම සඳහා ඉහත සඳහන් ජලාශ මතුපිට කොටස් සහ බිම් කොටස් වාර්ෂික බදු බලපත්‍ර මත ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දීම පිණිස වාරිමාර්ග අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ නේපාලයේ විදේශ කටයුතු ආයතනය (IFA) අතර අවබෝධතා ගිවිසුම අලුත් කිරීම**

ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ නේපාලයේ විදේශ කටයුතු ආයතනය (IFA) අතර සහයෝගිතාව හා පුහුණු හුවමාරුව වැඩි දියුණු කිරීමේ අරමුණින් 2018-09-01 දින සිට වසර 04ක කාලසීමාවක් සඳහා වලංගු වන පරිදි අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා ඇති අතර, එම අවබෝධතා ගිවිසුමේ කාලසීමාව 2022 වර්ෂයේදී අවසන් වී තිබේ. දෙපාර්ශ්වයේ එකඟතාව මත එකී අවබෝධතා ගිවිසුමේ ක්‍රියාත්මක කාලය වසර පසෙන් පසට (05) දීර්ඝ කිරීමට හැකි වන පරිදි විධිවිධාන සංශෝධනය කරමින් නව අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාරධර්ම පද්ධතිය) නියෝග**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(6) වගන්තිය මඟින් සාමදාන විනිශ්චයකාර තනතුර අත්හිටුවීම, අවලංගු කිරීම සහ අවසන් කිරීම සඳහා වන නියෝග සෑදීම පිණිස පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණ විෂයභාර ඇමතිතුමා විසින් 2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාරධර්ම පද්ධතිය) නියෝග සහ ඉන් පසුව එකී නියෝග සඳහා සිදු කරනු ලැබ ඇති සංශෝධනයන් පිළිවෙලින් 2023-11-27 සහ 2024-02-13 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයන් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **කෘෂිකර්ම නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

නවීන තාක්ෂණය හා නව දැනුම යොදා ගනිමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණයට හා දැවැන්ත පරිවර්තනයකට ලක් කළ ලෝකයේ අනෙකුත් රටවල්වල ආදර්ශයන් පාදක කර ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණයට ලක් කිරීම කෙරෙහි අවධානය

යොමු වී ඇත. ඒ අනුව, 2024 වර්ෂය සඳහා වන අයවැය මගින් කෘෂිකර්ම හා ධීවර නවීකරණ මණ්ඩල ශක්තිමත් කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති රුපියල් බිලියන 2.5ක මුදල යොදා ගනිමින් කෘෂිකර්ම නවීකරණ කේන්ද්‍රස්ථාන (Agriculture Modernization Hub) ස්ථාපිත කර කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම්වලට අනුව දිවයින පුරා කෘෂිකර්ම නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. මෙම වැඩසටහනේ පළමු අදියරේදී දිස්ත්‍රික්ක 25 තුළ තෝරා ගනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 26ක නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, දෙවන අදියරේදී සෑම දිස්ත්‍රික්කයකින්ම තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 බැගින් ආවරණය වන පරිදි දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 75ක් තුළ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂිතය. ඒ අනුව, පළමු අදියරේදී නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගනු ලබන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කෘෂිකර්ම නවීකරණ කේන්ද්‍රස්ථාන සඳහා රුපියල් මිලියන 25 බැගින් රුපියල් මිලියන 650ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන වෙත රුපියල් මිලියන 35 බැගින් රුපියල් මිලියන 175ක් වෙන් කරමින් කෘෂිකර්ම නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ඓතිහාසික සීතාවක ප්‍රදේශයේ කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම**

වර්ෂ 1521 දී සීතාවක රාජධානිය බිහි වීම ශ්‍රී ලංකා රාජධානි ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වන නමුත් එම රාජධානියෙහි ප්‍රාදේශීය අනන්‍යතාව ප්‍රදර්ශනය කිරීම සඳහා මේ දක්වා ස්ථානයක් ස්ථාපිත කර නොමැත. එබැවින්, සීතාවක රාජධානි යුගයේ නිෂ්පාදිත සිංහල තුවක්කු, සිංහල කඩු ඇතුළු යුධ උපකරණ, කිරුම් මිනුම් හා කැණීම් උපකරණ ආදි පුරාවස්තු මෙන්ම, සීතාවක රාජධානියට අයත් ප්‍රදේශයේ සිදු කරන ලද කැණීම් තුළින් සහ මහජනතාව සන්තකයේ පවතින දෑ අතුරින් හඳුනාගත් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ශිලා මෙවලම්, අතීත මානවයා විසින් භාවිත කරන උපකරණ හා ආහාර පිළිබඳ තොරතුරු මෙන්ම සතුන්ගේ හා ශාක අවශේෂ විධිමත් ලෙස මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට සැලසුම් කර ඇත. ඒ අනුව, සීතාවක ප්‍රධාන තැපැල් කාර්යාලයට යාබදව පිහිටි, දැනට ඌන උපයෝජිත තත්ත්වයේ පවතින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු නිල නිවසේ එකී කෞතුකාගාරය ස්ථාපිත කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය

පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා; බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කළ 2024 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු වෙත විධිමත් බැංකු මාර්ගයෙන් විදේශ ප්‍රේෂණ හුවමාරු කිරීම මත විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්ට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට 2022-08-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති අතර එම යෝජනා ක්‍රමයේ වලංගු කාලසීමාව 2024-06-30 දින දක්වා දීර්ඝ කිරීම සඳහා 2024-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ඒ සඳහා විධිවිධාන සලසමින් 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර ඇති 2024 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ගාල්ල වරාය වාණිජ හා විනෝදාස්වාද වරායක් ලෙස සංවර්ධනය කිරීම**

ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියට සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා විනෝදාස්වාද කටයුතුවලට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පදනම යටතේ සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම පිණිස අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීම සඳහා 2023-08-14 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, දියකඩනය, ගැඹුරු මඟී නැංගුරම්පොළ (වාප්පුව), රැඳවුම් බැම්ම, මුහුදු තාප්පය, ඇළ මාර්ග කැණීම් සහ ඉඩම් ගොඩකිරීම් ආශ්‍රිත සමුද්‍රීය ව්‍යුහ හා ගොඩ කරන ලද ඉඩම්වල පසුකාලීන මිශ්‍ර සංවර්ධන කටයුතු මූල්‍ය පහසුකම් යොදවා ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ පදනම මත ගාල්ල වරාය සංවර්ධනය කිරීමේ යෝජිත ව්‍යාපෘතිය සඳහා ආයෝජකයකු තෝරා ගැනීම පිණිස අභිලාෂ කැඳවීම/යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **රජයේ පාසල්වල 1-5 ශ්‍රේණිවල සිසුන් සඳහා "පාසල් ආහාර වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

සමස්ත පාසල් සිසුන් මිලියන 1.08ක් ආවරණය වන පරිදි දිවයිනේ අධ්‍යාපන කලාප 100ට අයත් පාසල් 7,902ක "පාසල් ආහාර වැඩසටහන" ක්‍රියාත්මක කරනු ලබන අතර, එක් සිසුවෙකු සඳහා දිනක ආහාර වේලක් වෙනුවෙන් රුපියල් 85/-ක මුදලක් වෙන් කර ඇත. වෙළෙඳපොළ තුළ සිදුවන භාණ්ඩ හා සේවාවන්හි මිල උච්ඡාවචනය අනුව එක් ආහාර වේලක් සඳහා අවම වශයෙන් රුපියල් 110/-ක පමණ මුදලක් වැය වන බව මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා පත් කළ නිලධාරි කමිටුව විසින් වාර්තා කර ඇත. එසේම, "පාසල් ආහාර වැඩසටහන" වෙනුවෙන් Save the Children සංවිධානය මඟින් 2024 වර්ෂය සඳහා තෝරාගත් පාසල් 917ක සිසුන් ලක්ෂ 2කට ආහාර ද්‍රව්‍ය වර්ග 03ක් ලබා දීමට එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එක් ආහාර වේලක් වෙනුවෙන් එක් සිසුවෙකු සඳහා වැය වන මුදල රුපියල් 110/- දක්වා වැඩි කිරීමටත්, ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා 2024 වර්ෂය තුළ දින 170ක් සඳහා "පාසල් ආහාර වැඩසටහන" ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **කොළඹ නගරය ආශ්‍රිතව ප්‍රධාන දුම්රිය ස්ථාන පිහිටි ගොඩනැගිලි වාණිජ මධ්‍යස්ථාන වශයෙන් වැඩිදියුණු කිරීම**

කොළඹ නගරය ආශ්‍රිතව පිහිටි වැල්ලවත්ත, බම්බලපිටිය, කොල්ලුපිටිය සහ කොම්පඤ්ඤවීදිය යන දුම්රිය ස්ථානයන් පිහිටි භූමින් හා ගොඩනැගිලි වාණිජ මධ්‍යස්ථාන වශයෙන් වැඩිදියුණු කිරීමේ ඉහළ විභවතාවක් පවතින බව 2023-11-06 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එකී දුම්රිය ස්ථාන සහ ඊට අමතරව දෙහිවල සහ ගල්කිස්ස දුම්රිය ස්ථාන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ ක්‍රමවේදය යටතේ සංවර්ධනය කිරීමටත්, ඒ සඳහා උනන්දුවක් දක්වන ආයෝජකයින් වෙතින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමටත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා; සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************